සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 2025
# Second Term Test - 2025

8 ශ්‍රේණිය | **පෙරදිග සංගීතය** | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

## I - කොටස

- **සියලු ම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 බිලාවල් රාගයේ,
(1) සියලු ස්වර ශුද්ධව යෙදේ. (2) රිගධනි කෝමලව යෙදේ.
(3) තීව්‍ර මධ්‍යමය යෙදේ. (4) ගනි පමණක් කෝමලව යෙදේ.

02 ''සිරස නමමු මව් පොළොවට'' මෙම බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයේ මුල් ස්වර පාදය කුමක් ද?
(1) ගමරි | ගමප | සරිග | මපප (2) ගමප | ගමරි | සරිග | රිසස
(3) ගමරි | මමග | සරිග | රිසස (4) ගමරි | ගමප | ධපම | පමග

03 මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්ථානි තාල පද දෙක සඳහන් පිළිතුර කුමක් ද?
(1) ජප් තාලය - කෙහෙර්වා තාලය (2) දාදරා තාලය - ජප් තාලය
(3) දීප්චන්දි තාලය - ත්‍රී තාලය (4) ජප් තාලය - දීප්චන්දි තාලය

04 ගීතයක ආරම්භක වාදනය හැඳින්වෙන්නේ,
(1) Chorus (කෝරස්) නමිනි. (2) Melody (මෙලඩි) නමිනි.
(3) Introduction (ඉන්ට්‍රඩක්ෂන්) නමිනි. (4) Counter (කවුන්ටර්) නමිනි.

05 බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ දී යොදා ගන්නා 𝅗𝅥 මෙම සංකේතයේ නම සහ වටිනාකම සඳහන් පිළිතුරු තෝරන්න.
(1) ක්‍රොචට් - 1 (2) සෙමිබ්‍රෙව් - 4 (3) මිනිම් - 2 (4) ක්වේවර් - ½

06 ''රන් | වන්ක | රල් | සැලෙයි'' මෙම ගී පාදය ප්‍රස්තාර කර ඇති තිත් රූපය කුමක් ද?
(1) සුළු මැදුම් දෙතිත (2) සුළු තනි තිත (3) මැදුම් තනි තිත (4) මැදුම් මහ දෙතිත

07 සිතාරයේ හා එස්රාජයේ ප්‍රධාන තත සුසර කරනු ලබන්නේ,
(1) මධ්‍ය ස ස්වරයට ය. (2) මන්ද්‍ර ප ස්වරයට ය. (3) මධ්‍ය ප ස්වරයට ය. (4) මන්ද්‍ර ම ස්වරයට ය.

08 භූපාලි රාගයට අයත් ස්වර ස්ථාපන ගී පාදය කුමක් ද?
(1) මුණිසිරි පාදේ (2) කඳු කඳු නැගෙනා
(3) ඇහැළ මහට ඇහැළ ගහක (4) කඳුපෙළ අතරේ තුරු වදුලේ

09 හිංදුස්ථානි තාල පද්ධතියේ තාලයක ප්‍රබලම ස්ථානයට හිමිවන සංකේතය වන්නේ කුමක් ද?
(1) 2 (2) 3 (3) 0 (4) X

10 සිතාරය හා එස්රාජය භාණ්ඩ දෙකෙහි. පර්දා පිහිටුවා නැති ස්වර දෙක කුමක් ද?
(1) ස ප (2) රි ධ (3) ප නි (4) රි ධ

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(මිස්රාබය / භජන් ගී / ගීමත් / අලුව / උපදේශාත්මක ගී / සැඳැස්මත් / Interlude / ගොයම් ගී / මව්පිය ගුණ)

11 ...................................... දෙවියන්ගේ ගුණ වර්ණනා කෙරෙන ගායන ශෛලියකි.
12 ගී පාදයක ලඝු, ගුරු අකුරුවල එකතුව ...................................... නම් වේ.
13 සිතාරය වාදනය කිරීම සඳහා ...................................... නම් උපකරණය භාවිත කෙරේ.
14 ගීතයක අතුරු වාදනය ...................................... ලෙස හැඳින්වේ.
15 ''අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී'' ගීතය ...................................... ඇතුළත් සරල ගීතයකි.

- **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

16 එස්රාජයේ ප්‍රධාන තත ''බාජ්කා තාර්'' නම් වේ. ( )

17 භූපාලි රාගයේ ශුද්ධ ස්වර 07 ම යෙදේ. ( )


18 දාදරා තාලය ආවර්ථ දෙකක් වාදනය කළ විට ලැබෙන මාත්‍රා සංඛ්‍යාව 14 කි. ( )

19 ගොයම් ගී යනු මෙහෙ ගී ගණයට අයත්වන ජන ගී විශේෂයකි. ( )

20 තාලම්පටින් නිකුත්වන ''තෙයි'' යන ධ්වනිය ''^'' මෙම ලකුණින් සංකේතවත් කරයි. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**




01 පහත A හා B රූප සටහන් වල දක්වා ඇත්තේ නිර්දේශිත රාග දෙකක ආරෝහණයට හා අවරෝහණයට අයත් වන ස්වර වේ.

(i) ඉහත A හා B රූප සටහන් දෙකෙහි ඇතුළත් ස්වර කුමන රාග වලට අයත් වේදැයි ඉංග්‍රීසි අකුරු සමඟ ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ඔබ විසින් නම් කරන ලද රාග දෙකේ ආරෝහණයන් හා අවරෝහණයන් රාග වල නම් ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 02)

(iii) ඉහත සඳහන් රාග දෙකෙන් එකක ස්වර ස්ථාපන ගීතයකට අයත් ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

02 |ධා ධිං ධිං ධා |ධා ධිං ධිං ධා |ධා තිං තිං තා |තා ධිං ධිං ධා

(i) ඉහත හින්දුස්ථානී තාලය නම් කරන්න. (ලකුණු 01)

(ii) එම තාලය නිවැරදි තාල සංඥා හා මාත්‍රා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) එම තාලයට ගැළපෙන දේශීය තිත් රූපයේ නම ලියන්න. (ලකුණු 01)

(iv) එම තිත් රූපයේ බෙර පදය ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

03 A - රන් දැකැති ගෙන නිති සැරසෙනවා

B - මේ කොතනින් ගෙනා ගොනා

(i) ඉහත A හා B අක්ෂර වලින් දැක්වෙන ගැමි ගී පාද අයත් ගී වර්ගය නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන් එක් වර්ගයකට අයත් ඔබ කැමති ගීතයක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ගැමි ගී වල විශේෂ ලක්ෂණ 04 ක් ලියන්න. (ලකුණු 04)

04 පහත දැක්වෙන්නේ රංග සම්ප්‍රදායන් 02 ට අයත් තොරතුරුය.


A. හින්දුස්ථානි සංගීතයේ ආභාසය ලබා ඇත.
B. මද්දලය වාදනය කරයි.
C. කර්ණාටක සංගීතයේ ආභාසය ලබා ඇත.
D. බලිවාලා ප්‍රමුඛ නෘත්‍ය කණ්ඩායම විසින් ආරම්භ කරන ලදී.
E. තබ්ලාව තාල වාද්‍ය භාණ්ඩය වේ.
F. වෙස්සන්තර, පද්මාවතී ප්‍රචලිත නාට්‍ය දෙකකි.
G. රංග භූමිය ''කරලිය'' නමින් හඳුන්වයි.
H. ඇහැලේපොල, කාලගෝල යනුවෙන් නාට්‍ය දෙකකි.

(i) ඉහත දැක්වෙන රංග සම්ප්‍රදායන් 02 නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉහත තොරතුරු ඒ ඒ රංග සම්ප්‍රදායන් දෙක යටතේ වගුගත කරන්න. (ලකුණු 04)

(iii) ඉන් එක් සම්ප්‍රදායකට අයත් ගීතයක පදමාලාවක් ලියන්න. (ලකුණු 04)

05




(i) ඉහත බටහිර ස්වර ප්‍රස්තාරයේ A සිට F දක්වා සලකුණු කර ඇති සංකේත පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 06)

(ii) ශුද්ධ ස්වර අෂ්ටකය බටහිර රේඛා මණ්ඩලය මත ක්‍රොචට් සංකේත මගින් ලකුණු කර පෙන්වන්න. (ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 1 | (02) | 2 | (03) | 4 | (04) | 3 | (05) | 3 | (06) | 1 | (07) | 4 |
| (08) | 3 | (09) | 4 | (10) | 2 | (11) | භජන් ගී | (12) | සඳැස්මත් | (13) | මිස්රාබ් | | |
| (14) | interlude | (15) | මව්පිය ගුණ | (16) | ✓ | (17) | × | (18) | × | (19) | ✓ | (20) | × |

(1 x 20 = 20)

## II කොටස

01 (i) A - භූපාලි රාගය B - බිලාවල් රාගය (ලකුණු 02)

(ii) භූපාලි → ආරෝහණය - ස රි ග ප ධ සं
අවරෝහණය - සं ධ ප ග රි ස (ලකුණු 02)

බිලාවල් → ආරෝහණය - ස රි ග ම ප ධ නි සं
අවරෝහණය - සं නි ධ ප ම ග රි ස (ලකුණු 02)

(iii) සිසුවා විසින් ලියා තිබෙන ගීතයේ නිරවද්‍යතාවය අනුව අදාළ ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

02 (i) ත්‍රී තාලය (ලකුණු 01)

(ii)

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාල සංඥා | x | | | | 2 | | | | 0 | | | | 3 | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| ඨේකාව | ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |

(ලකුණු 04)

(iii) මහ තනි තිත (ලකුණු 01)

(iv) | දො දො ං ත | ත කු දො මි | (ලකුණු 04)

03 (i) A - ගොයම් ගී B - කමත් ගී (ලකුණු 02)

(ii) සිසුවා ලියා ඇති ගීතය අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

(iii) සරල බස් වහර යොදා ගැනීම / නිශ්චිත රචකයෙකු නොමැති වීම / මුඛ පරම්පරාවෙන් පැවත ඒම / පටු ස්වර පරාසයක නාද මාලා පැවතීම / සිව් පද විරිත භාවිත කිරීම (ලකුණු 04)

04 (i) නූර්ති හා නාඩගම් (ලකුණු 02)


(ii)

| නූර්ති | නාඩගම් |
|---|---|
| A, D | B |
| E | C |
| F | G |

(ලකුණු 04)

(iii) සිසුවා විසින් ලියා ඇති ගීතය අනුව ලකුණු ලබා දෙන්න. (මුල් කොටස් 02 ලියා තිබීම ප්‍රමාණවත්ය) (ලකුණු 04)

05 (i) A - ස්ටාෆ් B - ට්‍රෙබල් ක්ලෙෆ් C - ක්‍රොචට් D - බාර්ලයින් E - මිනිම් F - සෙමිබ්‍රේව් (ලකුණු 06)

(ii) 


(ලකුණු 04)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

8 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

* **පහත සඳහන් 1, 2, 6 ප්‍රශ්නවලට අයත් ගීත සඳහා ගායනය තෝරාගත් සිසුන් ගායනයෙන් ද වාදනය තෝරාගත් සිසුන් වාදනයෙන් ද ඉදිරිපත් කරන්න.**

(01) භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 10 යි.)

(02) ඔබ උගත් නූර්ති හෝ නාඩගම් ගීයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 10 යි.)

(03) ඛඩප් තාලය හෝ දීප්චන්දි තාලය අතින් තාල තබන්න. (ලකුණු 05 යි.)

(04) ගොයම්, නෙළුම් ගී අතුරින් ඔබ කැමති ගීයක් ගායනය කරන්න. (ලකුණු 05 යි.)

(05) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් කෝමල ග නි සහිත ස්වර ස්ථාපන ගීයක් වාදනය කරන්න. (ලකුණු 10 යි.)

(06) තෝරා ගත් වාද්‍ය භාණ්ඩයකින් ඔබ කැමති ගීතයක් වාදනය කරන්න. (ලකුණු 10 යි.)